# 7 ශ්‍රේණිය - 03 වන වාරය

# නර්තනය හදාරන සිසුන්ට ඉගෙනුම් අත්වැලක්




අධ්‍යාපන අමාත්‍යාංශය

සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව

උපදේශණය - අධ්‍යාපන ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

- රාජ්‍ය ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

මග පෙන්වීම - එච්.යූ. ප්‍රේමතිලක මයා (අතිරේක ලේකම්, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)

- නීල් ගුණදාස මයා (අතිරේක ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ)

සම්බන්ධීකරණය - ආචාර්ය නිශාද් හඳුන්පතිරණ මයා (අධ්‍යාපන අධ්‍යක්ෂ වැ.බ.)

නියාමනය - මහීපාල උක්වත්ත මයා (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව)

**පාඩම් සැකසීම -**

- ආචාර්ය පාලිකා සමන්ති මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - විදේශ නර්තන අධ්‍යයන අංශය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය -කොළඹ
- මරීනා ද සොයිසා මිය - කථිකාචාර්ය - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම
- දීපමාල් විජේතුංග මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - අනුරාධපුරය
- සුගත් කරුණානායක මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ
- දුමින්ද සේනානායක මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - හෝමාගම
- හිමාලි ගමගේ මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය -මහනුවර
- කේ .එල් .ඒ .ධර්මලතා මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය දෙහිඕවිට
- අනෝමා කහදවආරච්චි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය කැළණිය

**7 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, "කොහොඹා කංකාරි ශාන්ති කර්මය" පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත. හොඳින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න.**

## කොහොඹා කංකාරි ශාන්ති කර්මය


### ශාන්ති කර්මයක් යනු

කිසියම් පුද්ගලයෙකුට මානසිකව හෝ කායිකව ඇතිවන්නාවූ ලෙඩක් දුකක්, මානසික වියවුල් තත්වයක් හෝ රටකට, ගමකට, ප්‍රදේශයකට හැදෙන්නාවූ වදුරු වසංගතයක්, ව්‍යසනයක් දුරු කරලීම උදෙසා දෙවියන්ට, යකුන්ට, හෝ ග්‍රහයින්ට නැතහොත් දේවත්වයෙහි ලා සලකන යම් කිසි කොට්ඨාසයක් උදෙසා පින් පෙත් පමුණුවා, එම කරදර දුරු කරන ලෙස පිහිටක් පතමින් සිදු කරන ක්‍රියාවක් නැතහොත් ප්‍රතිකර්මයක් ශාන්ති කර්ම වේ .

මෙම ශාන්ති කර්ම සම්ප්‍රදායන් තුනෙහිම පවතී. එම සම්ප්‍රදායන් හි ප්‍රධාන ශාන්ති කර්ම කීපයක් පහතින් දැක්වේ.

ශාන්ති කර්ම


| උඩරට | පහතරට | සබරගමු |
|---|---|---|
| කොහොඹා කංකාරිය<br>කඩවර කංකාරිය<br>වලියක් මංගල්‍යය<br>බලි | දෙවොල් මඩුව<br>රට යකුම<br>සූනියම් යාගය<br>සන්නි යකුම<br>මහ සොහොන් සමයම<br>බලි | පහන් මඩුව<br>කුමාර සමයම<br>දෙහි මඩුව<br>ගොපලු සමයම<br>බලි |



- කොහොඹා කංකාරිය ප්‍රචලිත  ප්‍රදේශ ලෙස  කන්ද උඩරට, සත් කෝරලය, සතර කෝරලය, යන  ප්‍රදේශවල ද  මහනුවර, යටි නුවර, හේවා හැට, හාරිස් පත්තුව යන ප්‍රදේශ  නම් කල හැක.
- ප්‍රධාන වාද්‍ය භාණ්ඩය **ගැට බෙරය** වේ.
- ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ **වෙස් ඇඳුම් කට්ටලයයි.**



වෙස් ඇඳුම් කට්ටලයෙන් සැරසී
නර්තනයක යෙදෙන  නර්තන ශිල්පියෙක්



ප්‍රධාන වාද්‍ය භාණ්ඩය -  ගැටබෙරය

## ❖ අතීතයේ පැවැත්වීමට හේතු

- **පඩුවස් දෙව් රජුට සැදුණු දිවි දෝෂය හා සෙත් පතා**

## ❖ වර්තමානයේ පැවැත්වීමට හේතු

- රටට ගමට සෙත් පතා
- සෞභාග්‍ය උදාකර ගැනීමට
- අධ්‍යාපනික අවශ්‍යතා සඳහා
- මතු පැවැත්ම උදෙසා සහ ශාන්ති කර්මයේ සංරක්ෂණය ට
- ලෙඩ දුක් සුව කර ගැනීම සඳහා

## ❖ පුද ලබන දෙවිවරු

- කොහොඹා දෙවි තුන් කට්ටුව (අලුත් කොහොඹා,මහ කොහොඹා.පරණ කොහොඹා)
- වීර මුණ්ඩ දෙවි
- දැඩි මුණ්ඩ දෙවි
- ඉරුගල් බණ්ඩාර දෙවි
- ගලේ බණ්ඩාර දෙවි

## ❖ කොහොඹා කංකාරි පුරා වෘත්තය

විජය රජු ඇතුළු පිරිස රටින් පිටුවහල් කිරීමෙන් පසුව ඔවුන් ලංකා ද්වීපයේ තම්මැන්නාවෙන් ගොඩ බසින ලදී . මොවුන් වතුර සොයා යන අතර, පළමු පිරිස නොපැමිණි නිසා විජය රජු ඇතුළු පිරිස ද ඒ සඳහා යොමු විය.

එහිදී කපු කටිමින් සිටින රූමත් ස්ත්‍රියක වූ කුවේණිය හමු වේ . යක්ෂ ගෝත්‍රික ඇය තම ගෝත්‍රයට එරෙහි වුවද විජය සමග එකතු වේ . මේ දෙදෙනාට **ජීවහත්ත** සහ **දිශාලා** නමින් දරු දෙදෙනෙක් සිටී. පසුව විජය රජු මදුරා පුරයේ ස්ත්‍රියක් විවාහ කරගෙන කුවේණිය සහ දරුවන් දෙදෙනා රජ මාලිගයෙන් පන්නා දමන ලදී.කුවේනිය වේදනාවෙන් විජය රජුට ශාප කරමින් මිය යන ලදී. විජය රජු සහ ඉන් පසුව රජ වන පඩුවස් දෙව් රජුට දිවි දෝශය හට ගන්නා ලදී.... ඉන් පසු ශක්‍ර දේවේන්ද්‍රයාට සැළ කිරීමෙන් පසුව, රාහු අසුරේන්ද්‍රයා මෙම කාර්යය පවරා දෙන ලදී... මලෙන් උපන් කුමරෙකු ලවා මෙම ශාන්තිය කල යුතු බවට නියම විය... පසුව මලෙන් උපන් මලය රජු ගෙන්වීමට උපක්‍රම යොදන ලදී... එය මෙසේය, විෂ්නු දෙවියන්ගේ දස අවතාර වලින් එකක් වන ඌරු අවතාරයක් ගෙන මලය දේශයේ මලය රජුගේ **නන්දන** නම් උයනට යන ලදී...එම ඌරා මලය රජුගේ මුළු උයනම පාළු කරන්නට විය. .මලය රජු තම උයන පාළු කරන ඌරා දැක ඒ පසුපස ලුහු බදින ලදී. මුහුද දෙබෑකර හන්තාන කන්ද පාමුලට පැමිණි එම ඌරා එතනදී ගලක් බවට පත්විය . ඌරා පසු පස ආ මලය රජු ඇතුළු තුන් කට්ටුවට පඩුවස් දෙව් රජුට වැළඳුන මෙම රෝගය ගැන අසනන්නට ලැබිණි. ඉන් පසුව මලය රජ පිරිස අනුරාධපුරයේ මහමෙව්නාව උයනේදී හැට පස් මංගල්‍යයක් කර ආපසු යන්නට පටන් ගත්හ.එම ආපසු ගමනේදී කොහොඹා ගහක් යට සිටි කුමාරයෙක්ට මෙම ශාන්ති කර්මය මතු පැවැත්මට උගන්වා ගිය බව විශ්වාසයයි.

ශාන්ති කර්ම හා සබැදි නර්තන ගායන වාදන අංග හා චාරිත්‍ර විධි

| චාරිත්‍ර විධි | නර්තන අංග | ගායනා අවස්ථා | වාදන අවස්ථා |
|---|---|---|---|
| කප් සිටුවීම<br>මඩු පේ කිරීම<br>මල පේ කිරීම<br>තොට පේ කිරීම<br>ආභරණ වැඩමවීම<br>මල් යහන් අයිලය<br>දෙවියන්ට පේ කිරීම | යක් ඇන්නුම<br>අස්නේ<br>ආවැන්දුම<br>හත් පද<br>දුනුමාලප්පුව<br>කොහොඹා හැල්ල<br>යක් තුන් පදය<br>මඩු පූරය | නමස්කාර කවි<br>අෂ්ටක<br>ශ්ලෝක<br>සැහැලි<br>සන්න<br>යාදිනි<br>සිරසපාද<br>කඩතුරා<br>කෝල්මුර<br>උපත් කවි | මගුල් බෙර<br>අත්‍යා බෙර<br>පි බෙර<br>දැකුම් අත් බෙර |





***Ura Yakkama depicting the killing of the pig as per the legend***

<u>සැරසිලි</u>

මඩුව වටා ගොක් කොළ සැරසිලි වලින් අලංකාර කරනු ලැබේ. මඩු සැරසීම, අයිලය මල් යහන්, පිදේනි තටු සැකසීම සඳහා විවිධ සැරසිලි කරනු ලැබේ. පොදුවේ ගත් කල කෙසෙල් පතුරු,ගොක් කොළ අමු ද්‍රව්‍ය ලෙස යොදා ගැනේ. ලී කෝටු, පට්ටා, කෙසෙල් කොළ, කෙසෙල් බඩ, හබරල කොළ ද භාවිතා කරයි. රංග භාණ්ඩ ද සැරසිලි වලට අයත් වේ. (ඌරා , දුන්න, ආදිය ද උදාහරණ වේ.) ප්‍රධාන ලෙස ස්වාභාවිකව යොදාගන්නා අමු ද්‍රව්‍ය භාවිතයට ගැනේ. හැට රියනක් දිගට නව රියනක් පළලට මඩුව සාදන අතර, තැඹිලි, නවසි, බෝදිලි, රඹ කැන් ආදිය එල්ලා සැරසිලි කළ බව පුරාතනයේ සිට පැවත එන්නකි. ප්‍රධාන ලෙස මල් යහන, අයිලය සාදනු ලබයි. <u>**අයිලය**</u> යනු දේව ආභරණ වැඩම කර තැන්පත් කර ඇති ස්ථානයයි.



## කාර්ය පත්‍රිකා

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ශාන්ති කර්ම කෙටියෙන් හඳුන්වන්න.
2. කොහොඹා කංකාරිය ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.
3. පුද ලබන දෙවිවරු කවරේද.
4. නර්තන හා ගායන අංග දෙක බැගින් ලියන්න.
5. අයිලය යනු කුමක්ද කෙටියෙන් ලියන්න.

පැවරුම

පහත වරහන් තුල දි ඇති ගැලපෙන පිළිතුරු තෝරා හිස්තැන් පුරවා ඡේදය සම්පූර්ණ කර ඔබ දක්ෂයෙක් දැයි ඔබම තිරණය කරන්න.

කොහොඹා කංකාරිය ශාන්ති කර්මය .................... නර්තන සම්ප්‍රදායට අයත්ය ........................ රජු කුවේනියත් ........................... සහ ................................ මාලිගයෙන් පන්නා දමන ලදී. විජය රජුටත්, .............................. රජුටත්, දිවි දොෂයක් හට ගන්නා ලදී. එම රෝගය දුරු කරවීම සඳහා .................... දේශයෙ මලෙන් උපන් මලය රජු ඇතුව පිරිස ගෙන්වා ගන්නා ලදී. මලය රජුගේ .......................උයන පාළු කරපු ඌරා ............... දෙබෑකර පැමිණ ............................ දී ගලක් බවට පත් විය............. අනුරාධපුරයේ ................................... උයනේදී .............................. මංගල්‍යක් පවත්වන ලදී. කොහොඹා කංකාරියේ ප්‍රධාන ඇඳුම් කට්ටලය ............................ යි. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ................................. බෙරයයි.

(ගැට/උඩරට/විජය/ජීවහත්ත/දිශාලා/පඩුවස්දෙව්/මලය/නන්දන/මුහුද/හන්තානේ/මලය රජ පිරිස/මහමෙව්නා/හැටපස්/වෙස්/

7 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, " කතරගම පෙරහැර " පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත . හොඳින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න

## කතරගම දේවාල පෙරහැර

කතරගම දේවාල පෙරහැර සිංහල, මුස්ලිම්, දමිල, ආදිවාසීන් වැනි සියලු ජනයාගේ ආගමික පෙරහැරක් වේ.

- පැවැත්වීමේඅරමුණු:
    1. බැතිමතුන්ගේ අපල උපද්‍රව දුරු කිරීම.
    2. ආශිර්වාදය ලැබීම සහ රටට සෙත් පැතීම
    3. වර්ෂාව සහ සශ්‍රීකත්වය අපේක්ෂාවෙන්
    4. ස්වභාවික විපත්වලින් රට බේරා ගැනීමට

- පෙරහැර පැවැත්වෙන කාලය

  කප් සිටුවීමෙන් දින 14ක් ගෙවී එළඹෙන අමාවක ගෙවී පුර පෑළවිය දිනයේ පුස නැකතින් මෙම පෙරහැර ආරම්භ වේ. ඇසළ මාසය පුරාවටම සිට වූ කප් කණුවේ කතරගම දෙවියන් වාසය කරන බවත්, ඒ නිසා කප පූජා වස්තුවක් ලෙසත් සළකනු ලැබේ.

- පෙරහැර හා බැඳි චාරිත්‍ර

  කතරගම දේවාලයේ වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන මංගල්‍යය තුනකි.
    - අවුරුදු මංගල්‍යය
    - ඇසළ උත්සවය
    - ඉල්මහ මංගල්‍යය

  ගිනි පෑගීම, බිම පෙරලීම, කටුගැසීම ආදී දුෂ්කර ක්‍රියාවන් දෙවියන් වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීම පිළිඹිබු කරයි.

  මඟුල් පෙරහැර දිනයේ විශේෂ කැවුම්,කිරිබත් සකස් කිරීම චාරිත්‍රයක් වශයෙන් සිදුවන්නකි. මේවා සකස් කරන්නේ දේවාලයේ තේවාකරුවකු වන විදානේ විසිනි. පෙරහැර පටන් ගැනීමේ දී "වත බැඳීම" නම් චාරිත්‍රයක් වේ. දේවාභරණ ගෙන යන ඇතු පිට වස්ත්‍ර ඇතිරීම වත බැඳීම නම් වේ.

- ගායන සහ වාදන අවස්ථා:


  මෙම පෙරහැරේ "වේගවත් පෙරහැර" නම් වූ විශේෂ පෙරහැරක් පැවැත් වේ. එය දුවන පෙරහැර නමින් ද හඳුන්වයි. මෙම පෙරහැර මහා දේවාලයේ සිට වල්ලි අම්මා දේවාලය වෙත ගමන් කරයි. එහි දී විශේෂ හේවිසි වාදනයක් දැකිය හැකිය. එහි දී වාදනය කරනු ලබන්නේ ඊටම සැකසුණු බෙර පදයකි. එය "වීර පදය" නම් වේ.දමිළ බෙර, නාගස්වරම් ආදී භාණ්ඩ වාදනය කිරීම මෙන්ම දේශීය වාද්‍ය භාණ්ඩ ද මෙහි දී භාවිතා කෙරේ.


දෙවියන් වැඩම කිරීමේ දී පිරිත් පැන් ඉසීමත් "හරෝ හරා" කිමත් තූර්ය වාදන, සණ්ටාර හා සීනු නාදයෙන් අවට පරිසරය ගිගුම් දෙයි.
පන්දම් කරුවන් ද, සුවඳ දිය සහ මල් ඉසින්නන් ද, කහ දියර ඉසින්නන් ද, ස්තෝත්‍ර හා ද්‍රවිඩ ගීත ගායනය කරන්නන් ද පෙරහැර දෙපසින් ගමන් කරයි. මෙහි දී සිංහල සහ ද්‍රවිඩ ජනතාවගේ එකමුතුකම ද පෙනේ.

- නර්තන රංග වස්ත්‍ර සහ සැරසිලි

පෙරහැරෙහි වැඩම කරවනු ලබන ශුද්ධ වස්තු , යන්ත්‍ර සහ දේව රූප ගෙන යනු ලබන්නේ කපුරාළය. එම මාර්ගය රතු පලසක් වැනි පාවාඩයකින් සහ සුදු වියනකින් සැරසීමත්, කපු රාළ මුඛ වාඩමකින් හා තලප්පාවකින් සැරසීම මෙහි දී දැකගත හැකිය. අලි ඇතුන්, විදුලි බුබුළු හා වීදි සැරසිලි වලින් පෙරහැර අලංකාර වේ.

පෙරහැරේ ඉදිරියෙන්ම සිටින්නේ ඉර හඳ නිරූපණය කරන ධජ, සේසත් දරන්නන් හා දිසා කොඩි දරන්නන් ය. ඊළගට බස්නායක නිළමේ හා දේවාලයේ ලේකම්වරයා දැකිය හැකිය. ඔවුන් දෙදෙනා දෙපස කපුරු සහ පහන් අතැති හේවාකරුවෝ සිටිති. දෙවියන් වැඩම කරන්නේ ප්‍රධාන කපුරාළ විසින් ඇතු පිටිනි. ඒ පසුපස අත්වැල් බැඳගත් "ආලත්ති අම්මලා" ගමන් කරති.
උඩරට, පහතරට, සබරගමු නැටුම් මෙන්ම කුළු, ගොයම්, රබන්, සවරන්, චාමර, වේවැල්, ලී, පතුරු, කඩු ආදී ගැමි නැටුම් ද සිංහ නැටුම, හනුමන්තා නැටුම, මොණර නැටුම ආදී නිර්මාණ නැටුම් වලින් මෙම පෙරහැර අලංකාරවත් වේ. කාවඩි නැටුම් සහ කොහොඹ කළය ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි නැටුම් ය. සාම්ප්‍රදායික බෙර වාදන ඇඳුම් කට්ටලය හා සාම්ප්‍රදායික නර්තන ඇඳුම් කට්ටල ද භාවිත කරන අතර නිර්මාණ ඇඳුම් කට්ටල ද මෙහි දී භාවිත කෙරේ. මෙම පෙරහැරේ ගායනය වාදනය සහ නර්තනය සඳහා ස්ත්‍රී පුරුෂ දෙපිරිසම සහභාගී වෙති.






1. කතරගම දේවාල පෙරහැර පැවැත්වෙන කාලය කුමක්ද.
2. පැවැත්වීමට හේතු ලියන්න.
3. පෙරහැරෙහි දක්නට ලැබෙන නර්තන අංග හා වාදන අංග ලියන්න.
4. පෙරහැර හා සම්බන්ධ සුවිශේෂ චාරිත්‍ර විධි නම් කරන්න.
5. පෙරහැරහි දක්නට ලැබෙන සැරසිලි අංග මොනවාද?
6. ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි නර්තන හා වාදන අංග ලියා දක්වන්න.

7 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, " වෙනත් සංස්කෘතීන්ට අදාල නර්තන අංග යටතේ කරගම් නර්තනය "පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත . හොදින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න.

වෙනත් සංස්කෘතීන්ට අයත් නර්තන

1. කරගම්
2. කාවඩි

❖ කරගම්

කරගම් ඉන්දීය ගැමි නැටුමකි.

- පැතිර පවතින ප්‍රදේශ

  තමිල්නාඩුව මූලික කොට ගෙන සහ පසුව තන්ජාවූර් නමැති පෙදෙසෙහි ද දක්නට ලැබෙයි.



- ආගමික පසුබිම

  ඉහත දක්වන ලද ප්‍රදේශයන් හි පවත්වන පුද පූජා අවස්ථාවන්හි දී කරගම් රඟ දැක්වනු ලැබේ. වර්තමානයේ පෙරහැර වලදී ද දැකිය හැකිය.

- පුදලබන දෙවි වරු
  1. මාරි අම්මාන් දෙවියන්
  2. ගංගා අම්මාන් දෙවියන්

- උත්සව පවත්වන කාල සීමාව

  වාර්ෂිකව අගෝස්තු මාසය තුල දී.


- කරගම් නර්තනය හා බැඳි විශේෂතා...

1. කළයක් හිස තබා නර්තනය කිරීම.
2. සමබර බව රැක ගනිමින් සරල චලන දැක්වීම.
3. කාන්තා, පුරුෂ දෙපක්ෂයම සහභාගී වීම.
4. තනි තනි ව මෙන්ම දෙදෙනා බැගින් ද නර්තනය දැක්වීම.

- කරගම් හා බැඳි රංග උපකරණ

ලෝහ නැතහොත් මැටියෙන් කරන ලද කළය විවිධ වර්ණයන්ගෙන් යුක්තය, වැඩි වශයෙන් රතු,සුදු සහ කහ මල් වලින් අලංකාර කෙරෙයි. සමබර බව රැකීම සඳහා කළය තුලට සහල් හෝ ධාන්‍ය දමනු ලබයි.


කළය මුදුනෙහි කඩදාසි වලින් සකස් කල ගිරවෙක් දක්නට ලැබෙයි. මලින් සරසන ලද කළයෙහි කවාකාර බව හා උස් බව ඉස්මතු කිරීමට බම්බු ලීයක් කළය තුලට සිරස් අතට දමයි. එහි වටා මල් වැල් එල්ලීම සිදු කෙරෙයි. නටන විට මල් වැල් සහ ගිරවා කවා කාරව කැරකෙන විට කරගම් නර්තනයෙහි චමත්කාර බව වැඩි වෙයි.




- සංගීත හා වාද්‍ය භාණ්ඩ

දකුණු ඉන්දියානු කර්නාට සංගීතය අනුව බෙර වර්ග හා නලා වාදනය ද, සමහර අවස්ථා වල දී ගීත ගායනය ද යොදා ගනී.

මූලික වාද්‍ය භාණ්ඩය ලෙස තවිල් බෙරය නම් වූ එක් අතකින් සහ කඩිප්පුවකින් වාදනය කරන වාද්‍ය භාණ්ඩය ද නාගස්වරම් නම් වූ සුශිර වාද්‍ය භාණ්ඩය ද යොදා ගනී.





- රංගවස්ත්‍රාභරණ

  ද්‍රවිඩ සංස්කෘතියට අයත් රංග වස්ත්‍රාභරණ, මෙන්ම කහ,රතු,කොළ වැනි වර්ණ යොදා ගනියි.

  - කාන්තාවන්ට
    - සාරිය/දිග සාය
    - හැට්ටය
    - ආභරණ
    - මල්මාලා
  - පුරුෂයින්ට
    - ධෝතිය
    - පූන නූල



- කරගම් නර්තනය පුහුණුවීම තුලින් වර්ධනය කරගත හැකි ගුණාංග සහ හැකියා
  1. ඉවසීම
  2. දරාගැනීමේ හැකියාව
  3. සමබරතාව
  4. විශ්වාසය
  5. සාමූහික බව

# කාර්ය පත්‍රිකාව

හිස්තැනට සුදුසු වචන වරහන් තුලින් තෝරා ලියන්න.

කරගම් යනු, 1 ....................................... ගැමි නර්තනයකි. 2 .................................... දෙවි පිදුම් ලබයි. සෑම වසරකම 3 ........................................ මාසය තුල එකී උත්සව පවත්වනු ලබයි. කරගම් හා බැදි රංග මෙවලම් සරසන ලද 4 ................................ කි. එය මුදුනෙහි 5.............................. රූපයක් සවිකර තිබෙයි. කරගම් නර්තනය සඳහා 6.................................... බෙරය වාදනය කරන අතර, සුසිර වාද්‍ය භාණ්ඩයක් ලෙස 7................................ භාවිත කරයි. රංග වස්ත්‍රාභරණ සඳහා කාන්තාවන් සාරියක් ද පිරිමි පක්ෂය 8...................................... ද අදිනු ලබයි. සැරසිලි සඳහා රතු,සුදු සහ 9.................................... වර්ණ භාවිත කරයි. මෙම නර්තනය තුලින් 10......................... හැකියාව වර්ධනය වෙයි.

(අගෝස්තු/ධෝතිය/ද්‍රවිඩ/ඉවසීම/ගිරා/මාරි අම්මාන්/නාගස්වරම්/කළය/තවිල්/කහ)

7 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, "නර්තන සම්ප්‍රදායට ප්‍රවර්ධනයට දායක වූවෝ" පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත . හොදින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න

නර්තන සම්පදාය ප්‍රවර්ධනයට දායක වූවෝ

## රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා

- සබරගමු නර්තන ශිල්පියෙකු ලෙස කටයුතු කළ රද්දැල්ලේ පොඩි මහත්තයා ශිල්පීය ඥානය ලැබුවේ පියාගෙනි. මුල් යුගයේ සබරගමු නර්තනය සීමා වී තිබුනේ ශාන්ති කර්ම වල රග දැක්වීමටත්, විහාරස්ථාන ආශ්‍රිතව පැවති පිංකම් ආදියටත් පමණි.එතුමා එම කටයුතු හොදින් වටහා ගන ඉගෙන ගෙන ඇත.

- 1947 වර්ෂයේ දී සබරගමු නර්තනය ඉගැන්වීමට සබරගමු කලායතනයක් ආරම්භ කළ මෙතුමාට 1959 වර්ෂයේදී නර්තන ගුරුවරයෙකු ලෙස පත්වීමක් ලැබිණි.

- 1964 දි ගිරාගම ගුරු විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවයට බැදුණු මෙතුමා ඉගැන්වීම සඳහා නියමිත කාලයට සීමා නොවී අමතර කාලය ද යොදා ගනිමින් සබරගමු නර්තන සම්ප්‍රදායය ඉගැන්වීම සඳහා ගුරු විද්‍යාලයීය කථිකාචාර්යවරයෙකු වශයෙන් මහත් කැපවීමකින් කටයුතු කළේය.

- ඉන් පසුව 1977-1990 දක්වා සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කළ එතුමා සිසුන් එකතු කර ගනිමින් ප්‍රසාංගිකව ඉගැන්වීම් කටයුතු වල නිරත විය. මේ නිසා වැඩි සිසුන් පිරිසක් නර්තන අධ්‍යාපනයට ප්‍රවිෂ්ට කරවීමට හැකිවිය. සබරගමු නර්තන විෂය මාලා සකස් කිරිමට මූලිකත්වයක් ලබා දුන් මෙතුමා ඒ පිළිබඳ වාද විවාද පවා සිදු කළේය.

- රද්දැල්ලේ පොඩි මහත්තයා කථිකාචාර්යතුමා සබරගමු නර්තනයටත්, ගායනයටත්,දවුල් වාදනයටත් එක හා සමාන දක්ෂතාවක් දැක්වූ කලා ශිල්පියෙකි. මෙතුමා නර්තන නිර්මාණයට සුවිශේෂ දක්ෂතාවක් දැක්වීය.

- පාසලට, ගුරු විද්‍යාලයට, විශ්ව විද්‍යාලයට පමණක් එතුමා සේවය සීමා කළේ නැත. ලැබෙන සෑම අවස්ථාවකම පහන් මඩු, ගම් මඩු ශාන්තිකර්මවලත් නර්තනයේ යෙදිණි. රද්දැල්ලේ පොඩි මහත්තයා නමින් මෙන්ම පරංගියා වත්තේ පොඩි මහත්තයා යන නමින් ද මෙතුමා හැදින්වේ.

## ජේ.ඊ. සේදරමන් මහතා

- 1908.09.23 වැනි දින උපත ලබා ඇති මොහු ප්‍රවීණ උඩරට නර්තන ශිල්පියෙකි. මහනුවර පුෂ්පදාන මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ඇත.

- පියා වූ මාදන සිරිසේන ගුරුතුමාගෙන් උඩරට නර්තනය, බෙර වාදනය චිත්‍ර ශිල්පය මූර්ති ශිල්පය නක්ශාත්‍ර ආදියත්, පන්සල ආශ්‍රයෙන් සිංහල, පාලි හා සංස්කෘත භාෂාව සහ කාව්‍යකරණයත් උගත් මෙතුමා දක්ෂ කලාකරුවෙකි.

- 1930 වර්ෂයේදී ප්‍රංශය බලා පිටත්ව ගිය ඔහු එහිදී සර්කස් කණ්ඩායමකට බැඳී නර්ථනයක් ඉදිරිපත් කර ඇත. ජර්මනිය, බෙල්ජියම, ස්විට්සර්ලන්තය, හංගේරියාව, ඉතාලිය සහ එංගලන්තය වැනි රටවලද සංචාරයේ යෙදෙමින් නර්තන ඉදිරිපත් කර ඇත.

- එංගලන්ත සංචාරයේදී රාගිනි දේවිය සමග රාධා ක්‍රිෂ්ණ නර්තනය ඉදිරිපත් කිරීමට මෙන්ම ඇයගේ නර්තන වැඩ සටහන් වල නර්තන අංග හයක් ඉදිරිපත් කිරීමටද අවස්ථාව ලැබී ඇත.ඔහු විසින් ලියන ලද “ සුන්දර යුරෝපය ” නම් කෘතියේ රාවණ නෘත්‍යයක් ද ඉදිරිපත් කර ඇති බව සඳහන් වෙයි. සංචාරක නැටුම් කණ්ඩායමක් සකස් කර ප්‍රේක්ෂකයන් ඉදිරියේ රඟුම් දැක්වීම, සර්කස් වල සහ ප්‍රදර්ශන රංගනයන් ඉදිරිපත් කිරීම ආදී කටයුතු ද කර ඇත.

### අධ්‍යාපන ක්ෂේත්‍රය උදෙසා ඉටු කර ඇති සේවය

1942 ජුනි 01 දින ගුරුවරයෙකු ලෙස මුල්ම පත්වීම ලබා ගනිමින් මාවතගම මහා විද්‍යාලයේ උඩරට නර්තනය විෂයක් ලෙස ඉගැන්වීම.

ගිරාගම, පේරාදෙණිය, පොල්ගොල්ල, මීරිගම,නි ට්ටඹුව යන ගුරු අභ්‍යාස විද්‍යාල වල නැටුම් හා සංගීත පරික්ෂකවරයෙකු ලෙස සේවය කිරීම.

ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ නැටුම් සහ සංගිත කථිකාචාර්යවරයකු ලෙස සේවය කිරීම.

**රචිත ග්‍රන්ථ**

- සිංහල නාට්‍ය කලාව - 1964
- නෘත්‍ය චින්තාමණී - 1949
- උඩරට නැටුම් කලාව - 1962
- නෘත්‍ය රත්නාකරය - 1959
- ලංකාවේ යක්ෂ යුගය - 1955
- සුභ ශාන්ති විධි නොහොත් ලංකාවේ බලි උපත - 1964
- බලියාග විචාරය නොහොත් ලංකාවේ බලි උපත - 1967

නිර්මාණය කරන ලද මුද්‍රානාට්‍ය කෘති

- පණ්ඩුකාභය
- තේලපත්ත
- විජය කුවේණි

කලාත්මක කටයුතු සඳහා පිහිටුවන ලද සංවිධාන

- ලංකා මහජන කලා මණ්ඩලය
- රාවණ කලා සංගමය

## එම්.එච්. ගෝමිස් මහතා

- පහත රට නර්තන සම්ප්‍රදායේ මාතර ශෛලියේ නර්තන ශිල්පියෙක් ලෙස ගෝමිස් මහතා හැඳින්විය හැකිය. රට යකුම හෙවත් රිද්දි යාගය, සූනියම් කැපිල්ල, මහසොහොන් සමයමන් වැනි ශාන්ති කර්ම පිළිබඳ පුළුල් දැනුමක් එතුමා සතුව පැවති අතර ප්‍රවීණ ශාන්ති කර්ම ඇදුරකු ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇත.
- නර්තන ශිල්පියකු ලෙස ගෝමිස් මහතා ප්‍රසිද්ධියට පත් වූයේ පහතරට සුවිශේෂ නර්තන අංග කිහිපයක් නිසාය. නාගකන්‍යා, ගිනි සිසිල, පන්දම් පාලිය වැනි නර්තන අංග ඉන් කීපයකි. කෝලම් නාටකයේ එන නාග කන්‍යා නැටුම ඉතාම සිත් ගන්නා සුළු ආකාරයට නිර්මාණය කරමින් වේදිකාවට උචිත ලෙස රංග වින්‍යාසය කළේ ගෝමිස් මහතාය. එසේම ගිනි සිසිල නැමති නර්තන අංගය ද වේදිකාවට උචිත ලෙස සකස් කොට ඉදිරිපත් කිරීමේ ගෞරවය ද ගෝමිස් මහතාට හිමි විය යුතුය.
- පහතරට නර්තනය වේදිකාවට උචිත ලෙස සකස් වී නොතිබුණු අවධියක ඒවා ක්‍රමවත්ව ඉදිරිපත් කිරීම සඳහා මෙතුමා දරා ඇති උත්සාහය අගය කළ යුතුය.
- ලෝකයේ රටවල් ගණනාවකම තමන්ගේ නර්තන හැකියාවන් ප්‍රදර්ශණය කළ මෙතුමා අන්තර්ජාතික වශයෙන් සම්මානයට පාත්‍ර වූවෙකි. සෞන්දර්ය අධ්‍යාපන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස වසර ගණනාවක් සේවය කළ ගෝමිස් මහතාගෙන් පහතරට නර්තන කලාවට සිදු වූ සේවය බොහෝ දෙනා අගය කරති.

පැවරුම

1. වගුව ඇසුරු කර ගනිමින් හිස්තැන් පුරවන්න.

| ශිල්පින්ගේ නම් | අයත් සම්ප්‍රදාය | ශිල්පීය දක්ෂතා | නර්තන කලාවට සිදුවූ සේවාව | නිර්මාණය කරන ලද කෘති |
|---|---|---|---|---|
| ජේ.ඊ.සේදරමන් | | | | උඩරට තාල ශාස්ත්‍රය |
| | | දවුල් වාදනය | | |
| | පහත රට නර්තන සම්ප්‍රදාය | | නර්තන කථිකාචාර්යවරයකු හා ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස සේවය කිරීම. | |

**7 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, "රාමසාන් උත්සවය" පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත . හොදින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න**

## රාමසාන් උත්සවය

### රාමසාන් උත්සවය යනු කුමක් ද?

අරාබිය,මැලේසියාව, ඉන්දුනිසියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව ආදී රටවල වෙසෙන ඉස්ලාම් බැතිමතුන් විසින් පවත්වන උත්සවයක් ලෙස රාමසාන් උත්සවය හැදින්විය හැකිය. මුස්ලිම් ආගමික නීතියට අනුව සෑම ඉස්ලාම් භක්තිකයකු විසින්ම අනිවාර්යයෙන් රැකිය යුතු "නෝම්බි ඇල්ලීම හෙවත් උපවාස ශීලය " මාසයක් පුරාවටම ආරක්ෂා කර අවසන් කරන දිනය රාමසාන් උත්සව දිනය ලෙස හැදින්වේ. එය රාමසාන් සඳ දැකීමේන පසුව සිදු කරනු ලබයි.

මෙම උපවාස ශීලය ආරම්භ වීමට හේතු වී ඇත්තේ ඉස්ලාම් භක්තිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය ලෙස හඳුන්වන "අල් කුර් ආනය" ලොව පහල වූ කාලය සිහිපත් කිරීමේ අභිප්‍රායයි. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සෑම ඉස්ලාම් භක්තිකයෙකු විසින්ම අනිවාර්යයෙන්ම රැකිය යුතු මෙම උපවාසය සඳහා අවුරුදු 07 ට අඩු වයස්වල දරුවන්ට ශරීර ශක්තියෙන් දුර්වල රෝගීන්ට සහ වයස්ගත වූවන්ට අවසර නොලැබේ.



❖ රාමසාන් උත්සවය පැවැත්වෙන කාලය:

සෑම වසරකම ජුනි මාසයේ පෝ දින සඳ (පුර හඳ) බැලීමෙන් පසුව යලි උදාවන ජුලි මාසයේ පෝ දින සඳ බැලීමෙන් අවසන්වන කාල සීමාව රාමසාන් උත්සවය සමරන කාලය ලෙස හැදින්විය හැකිය.



- **රාමසාන් උත්සවයේ සුවිශේෂී චාරිත්‍ර:**

  මෙම කාලසීමාව තුල සෑම දිනකම උදෑසන හිරු උදාවත් සමග ප්‍රථම යාඥාවෙන් ආරම්භ කරන උපවාසය හිරු බැසගිය පසු නිමා කොට ආහාර පිළියෙල කරගෙන දවසේම එකම ආහාර වේල අනුභව කිරීම මොවුන්ගේ සිරිතයි.

  අල්ලාහ් දෙවියන්ගේ ආශිර්වාදය මත මෙම කාලයේ දුප්පත් පොහොසත් භේදයකින් තොරව තමන් පිළියෙල කර ගන්නා ආහාර, ධන ධාන්‍ය වස්තු, ඇඳුම් පැළඳුම් බෙදා හදා ගැනීම සුවිශේෂී ලක්ෂණයකි. එමෙන්ම බොරු කීම , මත්පැන් පානය කිරීම වැනි දුසිරිත්වලින් මිදී උපවාස ශීලය රැකීම මෙම කාලය තුළ දක්නට ලැබේ. මානසික සංවරබව , කායික සංවර බව රැකගෙන යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා වසරකට වරක් මෙම උපවාස කාලය හෙවත් නෝම්බි ඇල්ලීම සිදු කරයි.

- **රාමසාන් උත්සවය සැමරීමේ ඇති වටිනාකම:**

නෝම්බි ඇල්ලීම අවසන් වූ පසු සිංහල අලුත් අවුරුදු චාරිත්‍රවල දී මෙන් නෑදෑ හිතවතුන්ගේ නිවෙස්වලට යෑම සිදු වේ. සියළු දෙනා අතර **එකමුතුභාවය** පිළිඹිබු කරමින් **සහයෝගයෙන්** යුතුව මෙම උත්සව සැමරීම මින් සංකේතවත් වේ. මේ අනුව සමගිය වැඩි දියුණු වී ආගමික වශයෙන් සහ ජාතික වශයෙන් එක් වී රාමසාන් උත්සවය සැමරීමට ලැබීම ඔවුන්ට දෙවියන් වහන්සේගෙන් ලැබුණු ආදර්ශයක් ලෙස සලකයි.



කාර්ය පත්‍රිකාව:

1. රාමසාන් උත්සවය පැවැත්වෙන කාලය ලියන්න.

2. ඉස්ලාම් භක්තිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය කුමක්ද?

3. මෙම කාල සීමාව තුල ඔවුන් විසින් ඉටු කරන චාරිත්‍ර 03ක් ලියන්න.

4. රාමසාන් උත්සවය පැවැත්වීමෙන් මුස්ලිම් ජනතාවගේ දක්නට ලැබෙන යහ ගුණ ගැන හොඳින් සිතා බලා ඒවායේ වටිනාකම තේරුම් ගන්න.